# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,748 - 2012 මාර්තු මස 02 වැනි සිකුරාදා - 2012.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 276 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 278 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය වියයුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 අප්‍රේල් මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | නුවරඑළිය | කොටගල කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ නුවරඑළිය කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

03-27

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයට ම ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට වැඩි නොවිය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2012 අප්‍රේල් මස 02 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඒ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2012 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | බලපිටිය | බලපිටිය කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |

03-26

## ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘතියට අනුව අයදුම්පත් "සර්වේයර් ජනරාල්, සර්වේයර් ජනරාල් කාර්යාලය, අංක 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05." යන ලිපිනයට 2012.03.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරය වම්පස ඉහළ කෙළවරේ "ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය. තැපෑලෙන් එවන අයදුම්පත් හැර වෙනත් ආකාරයෙන් එවන අයදුම්පත් භාරගනු නොලැබේ.

02. සියලුම අයදුම්කරුවන් පහත සඳහන් අවශ්‍යතා සපුරා ඇති බවට සහතික විය යුතුය.

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු බවත්,

(ආ) විශිෂ්ඨ චරිතයකින් යුක්ත හා ශාරීරික වශයෙන් යෝග්‍ය අයෙකු බවත්,

(ඇ) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ 33ට නොවැඩි බවත්, සතුටුදායක සාක්ෂි වලින් ඔප්පු කළ යුතුය.

(ඈ) අයදුම්පත් කැඳවන අවසන් දිනට සියලු අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබිය යුතුය.

03. *සේවා කොන්දේසි* :

(i) වැටුප් .— මෙම තනතුරට අයත් ඒකාබද්ධ මාසික වැටුප් පරිමාණය පහත දැක්වේ.
රා. ප. චක්‍රලේඛ අංක 06/2006 (iv) -MN-5A
රු. 16720 - 10 x 320 - 11 x 365 - 15 x 450 - රු. 30,685

(ii) තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

(iii) රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලටද ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1434/5 හා 2006.02.27 දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලටද එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධනවලට යටත්ව තෝරාගන්නා අපේක්ෂකයෙකු ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරට බඳවා ගනු ලැබේ.

04. *පත්වීමේ කොන්දේසි* :

(i) බඳවා ගනු ලබන නිලධාරීන් මාස 06ක දෙපාර්තමේන්තු කටයුතු පිළිබඳ පුහුණුවක් සඳහා යොදවනු ලැබේ.

(ii) බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබාදෙන රජයේ ගබඩා භාණ්ඩ වෙනුවෙන් රු. 25,000 ක මුදල් ඇපයකට බැඳිය යුතුය.

(iii) පුහුණු කාලයෙන් පසුව ඉදිරියට තවත් අවුරුදු 06ක කාලයක් ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ මිනින්දෝරුවරයෙකු වශයෙන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවය කිරීමට ඔවුන් යටත් වන අතර ඒ සඳහා රු. 1,50,000 කට නොඅඩු වත්කම් ඇති ඇපකරුවකු සමඟ ගිවිසුමකට හා ඇප ඔප්පුවකට ඔවුන් ඇතුළත් විය යුතුය.

05. *අධ්‍යාපන සුදුසුකම්* :
පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් ආයතනයකින් මැනුම් විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා තිබිය යුතුය.

06. *තෝරාගැනීමේ ක්‍රමය* :
සම්මුඛ පරීක්‍ෂණ ප්‍රතිඵල මත තෝරාගැනීම සිදු කරනු ලැබේ. මෙහිදී පිළිගත් විශ්වවිද්‍යාලයකින් මිනින්දෝරු විද්‍යා උපාධිය සමත්ව පිටවූ එකම කණ්ඩායමක අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. උපාධි විභාගයේ කුසලතා අනුපිළිවෙල ද සැලකිල්ලට ගනු ලැබේ. අයදුම්පත් ඉදිරිපත් කරන අදාළ සුදුසුකම් සපුරා ඇති සියලුම මිනින්දෝරු උපාධිධාරීන් සම්මුඛ පරීක්‍ෂණය සඳහා දැනුම් දුන් විට පහත සඳහන් ලියවිලිවල මුල් පිටපත් සහ ඒවායේ ඡායා පිටපත් කට්ටලයක් සමග සම්මුඛ පරීක්‍ෂණ මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුතුය.

(i) උප්පැන්න සහතිකය,

(ii) උපාධි සහතිකය ඇතුළු සෙසු අධ්‍යාපන සහතික,

(iii) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය,

(iv) චරිත සහතික දෙකක්. මෙයින් එකක් ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවක නිලධාරි සහතිකයක් විය යුතුය.

(v) පරිගණක හැකියාව පිළිබඳ සහතික,

(vi) මව් භාෂාවට අමතරව වෙනත් භාෂා පිළිබඳ දැනුම සනාථ කිරීම සඳහා සහතික,

(vii) ක්‍රීඩා කුසලතා පිළිබඳ සහතික.

07. අවශ්‍ය කොන්දේසි සපුරා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. අයදුම්කරුවෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් සම්මුඛ පරීක්‍ෂණයට කලින් හෝ සම්මුඛ පරීක්‍ෂණය පවත්වන කාලයේදී හෝ ඉන්පසුව හෝ ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්‍ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත.

09. දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරියෙකු නම් තම අයදුම්පත දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරුවන් තැපෑලෙන් එවන අයදුම්පත් නැතිවීම ගැන වගකීම් භාරගනු නොලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

එස්. එම්. ඩබ්ලිව්. ප්‍රනාන්දු,
සර්වේයර් ජනරාල්,
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව.

2012 පෙබරවාරි මස 17 වැනි දින,
අංක 150,
කිරුළ පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා අයදුම්පත**

01. නම :————.
1.1 මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා :SILVA, A. B. )

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය :————.
1.5 නිකුත් කළ දිනය :————.

02. ලිපිනය :
2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 ලිපි එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

03. ජන වර්ගය :

සිංහල 1, දෙමළ 2, ඉන්දියානු දෙමළ 3, මුස්ලිම් 4, වෙනත් 5
(අදාළ කොටුව තුළ අංකය ලියන්න)
3.1 පුරවැසිභාවය
පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන්ද යන වග සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් ලියාපදිංචි අංකය සඳහන් කරන්න.)

04. ස්ත්‍රී පුරුෂභාවය :
ස්ත්‍රී -1, පුරුෂ - 0
(අදාළ කොටුව තුළ අංකය ලියන්න.)

05. විවාහක/අවිවාහකභාවය :————.

06. උපන් දිනය :
වර්ෂය :————. මාසය :————. දිනය :————.
6.1 ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනයට වයස :
අවුරුදු :————. මාස :————. දින :————.

07. අධ්‍යාපන සුදුසුකම් :
(i) විශ්ව විද්‍යාලය/ආයතනය :————.
(ii) උපාධිය හා සමත් වූ වසර :————.
(iii) ලියාපදිංචි වූ අංකය හා දිනය :————.
(iv) බාහිර/අභ්‍යන්තර :————.
(v) විභාග අංකය :————.
(vi) පන්තිය (ඉහළ/පහළ) :————.
(vii) විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය :————.

08. පරිගණක විද්‍යාව පිළිබඳ හදාරා ඇති පාඨමාලා විස්තර :————.

09. මව් භාෂාවට අමතරව වෙනත් භාෂාවන්ගේ දැනුම :————.

10. ක්‍රීඩා කුසලතා :————.

11. වෙනත් සුදුසුකම් :————.

12. කිසියම් චෝදනාවක් සම්බන්ධයෙන් ඔබ උසාවියෙන් වරදකරු වී ඇත්නම් ඒ හා සම්බන්ධ සියළුම විස්තර දැන්විය යුතුය. :————.

13. ඔබ දැනට රජයේ සේවයේ නියුතු අයෙකු නම් අයදුම්පත් භාරගන්නා දිනට වැඩ තහනමකට ලක්ව තිබේද යන්න. :————.

මා විසින් ඉහතින් ඉදිරිපත් කර ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති විස්තර කිසිවක් වැරදි හෝ අසත්‍ය බැව් අනාවරණය වුවහොත් තෝරා ගැනීමට සලකා බලනු නොලබන බවත් හා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම හොඳාකාරව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා පමණක් මෙම කොටස අදාළ වේ.)

සර්වේයර් ජනරාල්,

මෙම ආයතනයේ සේවය කරන ඉහත සඳහන් ........................ මහතා/මහත්මිය/මෙනෙවිය ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදිය. ඔහු/ඇය කිසියම් විනයානුකූල දඬුවමකට භාජනය කර නොමැති අතර මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් නිදහස් කරනු හැකිය./නොහැකිය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන,
නිල මුද්‍රාව.

දිනය :————.

03-273

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2012 (I)

01. ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය, සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණ, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අධීක්ෂණය හා මෙහයවීම යටතේ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ විසින් 2012 අප්‍රේල් මස 28 සිට 2012 මැයි මස 26 දක්වා සති අන්ත දිනවල කොළඹ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ දෙකටම එකවර ඉදිරිපත්වීමට හැකි වන පරිදි කාල සටහන් සකස් කරනු ලැබේ.

03. ඉහත සේවාවන්ට අදාළව පැවැත්වීමට නියමිත කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ දෙවනි භාෂාව පිළිබඳ පරීක්ෂණ පහත සඳහන් පරිදි වේ. :-

| *අනු. අංකය* | *විභාගයේ නම* | *සංකේතය* |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | A |
| 02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | B |
| 03 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | C |
| 04 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | D |
| 05 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | E |
| 06 | දෙවන භාෂා පරීක්‍ෂණය (අදාළ සියලු සේවාවන් සඳහා) | F |

04. තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවල දී පෙනී සිටීමට නිලධාරීන්ට හැකි වේ. එසේකුදු වුවත් නියම කර ඇති කාලසීමාව තුළ කාර්යක්‍ෂමතා කඩඉම් පරීක්‍ෂණ සමත්වීම අත්‍යාවශ්‍ය වේ.

05. මෙම විභාගය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්‍ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

06. ඉල්ලුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු ය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්‍ෂකයින් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්‍ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් 2012 මාර්තු මස 26 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ අධ්‍යක්‍ෂ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, අංක 28/10, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

07. *අයදුම්පත්‍ර.*—අංක 1.0 සිට 5.0 දක්වා ඡේදයන් පළමුවැනි පිටුවට ද ඉතිරිය ඊළඟ පිටුවලට ද ඇතුළත් වන පරිදි “ඒ 4 ” ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය පිළියෙල කළ යුතු ය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත්අකුරින්ම පිරවිය යුතු ය. අයදුම්පත මේ සමඟ ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ.

7.1 ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු අතර එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

7.2 *විභාග ගාස්තු.*—පළමුවරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේකුදු වුවත් ඉන්පසු වාරවල දී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට හෝ විෂයයන් එකකට වඩා වැඩි සංඛ්‍යාවකට පෙනී සිටින්නේ නම් රු. 115 ක් ද, එක් විෂයයක් සඳහා පමණක් පෙනී සිටින්නේ නම් රු. 75 ක් ද, විභාග ගාස්තු ලෙස ගෙවිය යුතු අතර එම මුදල ලංකා බැංකුවේ, නිදහස් චතුරශ්‍ර ශාඛාවේ, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ, අධ්‍යක්‍ෂ නමින් පවත්වාගෙන යනු ලබන ගිණුම් අංක 02323276 ට බැර කර ලබා ගන්නා රිසිට් පත අයදුම්පත්‍රය සමග අමුණා එවිය යුතු ය. මොනම කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ.

08. අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ විසින් විභාග කාල සටහනේ පිටපතක් සමඟ ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අපේක්‍ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

09. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දන්වා සිටිය යුතු ය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහතික කළ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත යොමු කර ප්‍රවේශ පත්‍රය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය. තව ද ඉහත ලේඛන ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්‍ෂකයින් විසින් පසුව කරනු ලබන විමසීම් සළකා බලනු නොලැබේ.

10. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

11. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව.*—අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ය :-

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ,

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් ලියවිල්ලක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවකුගේ අපේක්ෂකත්වය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය.

12. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් මෙම විභාගය පැවැත්වෙන අතර යම් අපේක්ෂකයෙකු තමාට හිමිකම් නොමැති මාධ්‍යකින් විභාගයට පෙනී සිටි බැව් පසුව හෙළි වුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. *විභාග පරිපාටිය.*—එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා වන විෂයයන් සහ විෂය නිර්දේශයන් පහත සඳහන් පරිදි වේ:-

13.1 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (2005.11.14 දිනැති අංක 1419/3 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ඈ" පරිශිෂ්ටය)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ:

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | පැය 03 යි | 01 |
| 02 | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | පැය 03 යි | 02 |
| 03 | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | පැය 03 යි | 03 |
| 04 | පරිපාලනය | පැය 03 යි | 04 |
| 05 | ආර්ථික විද්‍යාව | පැය 03 යි | 05 |
| 06 | සමාජ විද්‍යාව | පැය 03 යි | 06 |
| 07 | ඉංග්‍රීසි | පැය 03 යි | 07 |

13.1.1 *ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය (විෂයය අංකය 01)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:-

(i) ඓතිහාසික සංවර්ධනය ද ඇතුලුව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හා දෙවැනි ජනරජ ව්‍යවස්ථාව,
(ii) විධායකය, ජනරජයේ ජනාධිපති, අමාත්‍ය මණ්ඩලය හා අගමැති, මධ්‍යම රජයේ දෙපාර්තමේන්තු හා රාජ්‍ය සේවය,
(iii) යුක්තිය පසිඳලීම,
(iv) පරිපාලනය සම්බන්ධ අධිකරණ පාලනය,
(v) රාජ්‍ය ප්‍රතිපත්තිය උදෙසා මාර්ගෝපදේශ ප්‍රතිපත්ති සහ මූලික යුතුකම්,
(vi) අභිනියෝජන ව්‍යවස්ථා,
(vii) රජයේ හා රාජ්‍ය අධිකාරීන් හි වගකීම්,
(viii) මූලික අයිතිවාසිකම්.

13.1.2 *ශ්‍රී ලංකාවේ නීති ක්‍රම (විෂයය අංකය 02)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:-

(i) ශ්‍රී ලංකාවේ නීති ඉතිහාසය,
(ii) අධිකරණ සංවිධානය,
(iii) ශ්‍රී ලංකාවේ උසාවි ආඥාපනත (6 පරිච්ඡේදය),
(iv) 1971 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනත.

13.1.3 *අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය (විෂයය අංකය 03)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:-
(i) දණ්ඩ නීති සංග්‍රහය,
(ii) සාක්ෂ්‍ය ආඥාපනත.

***සටහන.***—අපේක්ෂකයෙකු ඉහත 13.1.1, 13.1.2 සහ 13.1.3 හි සඳහන් එක් එක් විෂයය සඳහා අවම වශයෙන් 35% ක ලකුණු ප්‍රමාණයක් සහ විෂයයන් 03 හි මුළු ලකුණුවලින් 40% ක සාමාන්‍යයක් ලබා ගත යුතු වේ.

13.1.4 *පරිපාලනය (විෂයය අංකය 04)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:-
(i) කාර්යාල හා ක්ෂේත්‍ර කටයුතු සංවිධානය කිරීම හා සංවිධාන ක්‍රම,
(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009.02.20 දිනැති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති සහ ආයතන සංග්‍රහයේ පහත දැක්වෙන පරිච්ඡේද:
VI, VII, IX, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII, XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII සහ XLVIII.

*සටහන.*— මෙම විෂයය සඳහා අපේක්ෂකයකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.5 *ආර්ථික විද්‍යාව (විෂයය අංකය 05)/සමාජ විද්‍යාව (විෂයය අංකය 06)*
අපේක්ෂකයන් ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව යන විෂයයන්ගෙන් එක් විෂයයකට පමණක් පෙනී සිටිය යුතු ය.

13.1.5.1 *ආර්ථික විද්‍යාව (විෂයය අංකය 05)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:-
(i) වටිනාකම, නිෂ්පාදනය හා බෙදා හැරීමේ න්‍යායන් පිළිබඳ විශේෂ අවධානයක් සහිතව ආර්ථික විද්‍යාවේ මූලධර්ම,
(ii) මුදල්, මූල්‍ය කටයුතු හා මුදල් න්‍යාය,
(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය.

*සටහන.*— මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.5.2 *සමාජ විද්‍යාව (විෂයය අංකය 06)*
ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ අවධානය සහිතව පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:
(i) සමාජ ව්‍යුහය, සංවිධානය හා කාර්යයන්,
(ii) මානව සම්බන්ධතා හා කණ්ඩායම්,
(iii) බන්ධුත්වය, විවාහය හා පවුල,
(iv) ග්‍රාමීය හා නාගරික සමාජය,
(v) සමාජ ස්ථරායනය හා විභේදනය,
(vi) සමාජීය පාලනය,
(vii) සංස්කෘතිය, ආගම, සදාචාරය හා හරපද්ධතීන්.

*සටහන.*— මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.1.6 *ඉංග්‍රීසි (විෂයය අංකය 07)*

මෙම විෂයය සඳහා අදාළ විෂය නිර්දේශය පහත පරිදි වේ:

(i) *Listening and Speaking Skills*.—The candidate should possess the ability to function effectively in the following language functions:-

* General Greetings and Introductions,
* Giving and Getting Information,
* Advising, Suggesting and Expressing Opinions,
* Describing Events and Situations,
* Telephone Skills,
* Interviewing Skills,
* Meeting,
* Listening and Note Taking skills.

(ii) *English Grammar.*—A suitable level of proficiency on the following forms of grammar in the Spoken and the Written language is expected from the candidate:-

* Tense and Number,
* Sentences (Simple/Compound/Complex/Compound Complex),
* Relative Clauses,
* Reported Speech,
* Adjectives and Adverbs,
* Determiners,
* Prepositions,

(iii) *Writing Skills.*—The knowledge on the modern formats and styles of writing is tested in this area of study.
* Internal Modes of Communication,

* Formal Correspondence Skills,
* Writing Descriptions/Explanations,
* Summary Writing Skills,
* Report Writing Skills,
* Meeting Minutes/Agendas/Invitations,
* Comprehension.

(iv) *Reading Skills.*—Candidate's ability to comprehend a printed text, infer meaning and verbal/written interpretation is expected.

* Reading and understanding the specific and general meaning of a printed text,
* Reading and Interpretation (verbal/written),
* Understanding the cohesion and coherence of a passage.

*සටහන.*-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2 ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය : (2005.11.14 දිනැති අංක 1419/3 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා පරිපාලන සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ "ඇ" පරිශිෂ්ඨය)

මෙම විභාගය සඳහා වන විෂයයන් පහත දැක්වේ:

| *අනු. අංකය* | *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|
| 01 | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 08 |
| 02 | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) | පැය 03 යි | 09 |
| 03 | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | පැය 03 යි | 10 |
| 04 | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | පැය 03 යි | 11 |

13.2.1. *ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 08)*
ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති සම්පාදනයෙහි ලා බලපාන කරුණු මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි. ශ්‍රී ලංකාවේ මෑත කාලීන ආර්ථික, සමාජ හා දේශපාලන ඉතිහාසය තුළ ආර්ථික විද්‍යා සහ සමාජ විද්‍යා මූලධර්මයන් උපයෝගී කරගත් ආකාරය පිළිබඳ කරුණු මත මෙම ප්‍රශ්න පත්‍රය සකස් වී ඇත.

*සටහන.*-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.2 *සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය (ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානය සහිතව) (විෂයය අංකය 09)*
ශ්‍රී ලංකාව කෙරෙහි විශේෂ අවධානයක් සහිතව පහත කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් සංවර්ධන පරිපාලනය භාර වූ ආයතන, ඒවායේ ක්‍රියාකාරිත්වය හා අන්තර් සම්බන්ධතාවයන් මත පදනම් වූ ප්‍රශ්න පත්‍රයකි:-

(i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රය;
(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය පසුබිම;
(iii) පළාත් සභා හා පළාත් පාලන;
(iv) මහජන සංවිධාන;
(v) රාජ්‍ය සංස්ථා.

*සටහන.*-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.3 *කළමනාකරණය හා සංවිධාන ක්‍රම (විෂයය අංකය 10)*

පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි:—

(i) කළමනාකරණය හා සංවිධානය පිළිබඳ මූලධර්ම;
(ii) එම මූලධර්ම රාජ්‍ය අංශයේ පැන නගින ගැටලු හා ප්‍රශ්නවලට අදාළ කර ගැනීම;
(iii) කළමනාකරණය පිළිබඳ නූතන ක්‍රමවේදයන් හා ශිල්ප ක්‍රම.

*සටහන.*-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.2.4 *රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය (විෂයය අංකය 11)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) ශ්‍රී ලංකාවේ මූල්‍ය පාලනය-
රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ ව්‍යවස්ථාමය විධිවිධාන,
රාජ්‍ය මූල්‍ය සම්බන්ධ පාර්ලිමේන්තුවේ පාලනය,
අරමුදල් යන්නෙහි අර්ථය,
ඒකාබද්ධ අරමුදල සහ එහි ක්‍රියාකාරිත්වය,
විසර්ජනයේ අරමුණ හා විසර්ජන ක්‍රම,
අවිනිශ්චිත අවස්ථා අරමුදල,
වෙනත් අරමුදල් හා ඒවායේ ක්‍රියාකාරිත්වය,
රාජ්‍ය ආදායම,
මුදල් ඇමතිවරයාගේ බලතල හා කාර්ය භාරය, භාණ්ඩාගාරයේ බලතල හා කාර්යභාරය,
වොරන්ට් සහ අග්‍රිම අධිකාරිය,
විගණකාධිපති, ඔහුගේ බලතල හා කාර්ය භාරය,
රාජ්‍ය වියදම් කමිටුව,
රාජ්‍ය ව්‍යාපාර කමිටුව,

(ii) ගිණුම් නිලධාරීන්, ප්‍රධාන ගිණුම් නිලධාරීන් හා රාජ්‍ය ආදායම පිළිබඳ ගිණුම් නිලධාරීන් පත් කිරීම, ඔවුන්ගේ බලතල හා කාර්යභාරය;

(iii) අභ්‍යන්තර විගණනය;

(iv) රාජ්‍ය වියදම් සැලසුම් කිරීම හා කළමනාකරණය. :—
සංවිධානවල අරමුණු හා කාර්ය භාරයන් හඳුනාගැනීම,
රාජ්‍ය ප්‍රතිපත්ති, පරමාර්ථ, ඉලක්ක හා වැඩ සටහන් හඳුනාගැනීම,
සංවර්ධන ව්‍යාපෘති, වැඩ සටහන් සැලසුම් කිරීම හා ඇගයීම හා ප්‍රමුඛතාකරණය,
වාර්ෂික ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීම හා අවසන් තීරණ ගැනීම,

(v) අනුමත වියදම් ඇස්තමේන්තුවල වෙනස්කම් කිරීම :—
විරමොං පරිපාටිය ක්‍රියාත්මක කිරීම,
රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යා හා වැටුප් කළමනාකරණය,
මුළු පිරිවැය ඇස්තමේන්තු හා ඒවා ප්‍රතිශෝධනය කිරීම,
පරිපූරක ඇස්තමේන්තු,

(vi) රජයේ දේපළවල පාඩු හා අත්හැරීම්;

(vii) විවිධ ගිණුම් කටයුතු;

(viii) මූල්‍ය කළමනාකරණය සඳහා කාර්ය භාරයන් පැවරීම;

(ix) රජයේ මුදල්වල භාරකාරත්වය හා බැංකු ගිණුම් පරිපාටිය;

(x) රජයේ සැපයුම් ක්‍රියා පරිපාටිය;
භාණ්ඩ සේවා හා වැඩ ලබා ගැනීම,
ටෙන්ඩර් මණ්ඩල හා තාක්ෂණ ඇගයුම් කමිටුවල සංයුතිය,
පත්කිරීම බලතල හා කාර්ය භාරය,
ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියා පරිපාටිය,
විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතිවල කළමනාකරණය.

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතු ය.

13.3 ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමු කාර්යක්ෂමතා කඩඉම් විභාගය :

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක්වේ :—

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| මූල්‍ය ක්‍රම | පැය 03 යි | 12 |
| පරිපාලනය | පැය 03 යි | 04 |

13.3.1 *මූල්‍ය ක්‍රම : (විෂයය අංකය 12)*
පහත දැක්වෙන කරුණු මත පදනම් වන ප්‍රශ්න පත්‍රයකි. :—

(i) ශ්‍රී ලංකා ආණ්ඩුවේ මුදල් රෙගුලාසි 1 වැනි කාණ්ඩය (X වැනි පරිච්ඡේදය හැර)

(ii) ගෙවී යන වර්ෂයේ ඇස්තමේන්තු. *උදා :* ඒවා සකස් කිරීම, ශීර්ෂ, මූල්‍ය ක්‍රම සහ විසර්ජන පනත්

*සටහන*.-මෙම විෂයය සඳහා අපේක්ෂකයෙකු අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබාගත යුතු ය.

13.3.2 *පරිපාලනය : (විෂයය අංකය 04)*
මෙම විෂයයට අදාළ විෂය නිර්දේශය 13.1.4 ඡේදයෙහි දැක් වේ.

13.4 *දෙවන භාෂා පරීක්‍ෂණය (අදාළ සියලු සේවාවන් සඳහා)*
සිංහල භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් දෙවන භාෂාව, දෙමළ භාෂාව වන අතර දෙමළ මාධ්‍යයෙන් සේවයට පත්කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සම්බන්ධයෙන් දෙවන භාෂාව, සිංහල භාෂාව වේ. ඉංග්‍රීසි භාෂා මාධ්‍යයෙන් සේවයට පත් කිරීමට සුදුසුකම් ලැබූ නිලධාරියෙකු සිංහල හා දෙමළ යන භාෂා දෙක පිළිබඳ පරීක්‍ෂණවලින් සමත් විය යුතු ය.

මෙම විභාගයන් සඳහා වන විෂයයන් පහත දැක් වේ. :—

| *විෂයය* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|
| දෙවන භාෂා පරීක්‍ෂණය - සිංහල (ලිඛිත) | පැය 02යි | 13 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - දෙමළ (ලිඛිත) | පැය 02යි | 14 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - ඉංග්‍රීසි (ලිඛිත) | පැය 02යි | 15 |

| *විෂයය* | *විෂයය අංකය* |
|---|---|
| දෙවන භාෂා පරීක්‍ෂණය - සිංහල (වාචික) | 16 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - දෙමළ (වාචික) | 17 |
| දෙවන භාෂා පරීක්‍ෂණය - ඉංග්‍රීසි (වාචික) | 18 |

*සටහන*.—දෙවන භාෂා පරීක්‍ෂණයේ ලිඛිත විභාගය සමත් වන අයදුම්කරුවන් පමණක් වාචික පරීක්‍ෂණය සඳහා කැඳවනු ලැබේ.

14. මෙම විභාගය 2012 අප්‍රේල් මස 28 දින සිට 2012 මැයි මස 26 දක්වා කොළඹ දී පැවැත්වෙන අතර විභාග කාල සටහන පහත පරිදි වේ. :—

| *අනු. අංකය* | *විභාගයේ නම* | *විෂයය* | *විෂය අංකය* | *දිනය* | *වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය | 01 | 2012.04.28 | 9.00 - 12.00 |
| | | ශ්‍රී ලංකාවේ නීති ක්‍රම | 02 | 2012.04.28 | 12.30 - 3.30 |
| | | අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | 03 | 2012.04.29 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2012.04.29 | 12.30 - 3.30 |
| | | ආර්ථික විද්‍යාව | 05 | 2012.05.12 | 9.00 - 12.00 |
| | | සමාජ විද්‍යාව | 06 | 2012.05.12 | 9.00 - 12.00 |
| | | ඉංග්‍රීසි | 07 | 2012.05.13 | 12.30 - 3.30 |
| 02 | ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන දෙවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | ආර්ථික හා සමාජ ප්‍රතිපත්ති | 08 | 2012.05.13 | 9.00 - 12.00 |
| | | සංවර්ධන පරිපාලන පිළිබඳ ක්‍රියාවලිය | 09 | 2012.05.13 | 12.30 - 3.30 |
| | | කළමනාකරණය හා සංවිධාන ක්‍රම | 10 | 2012.05.19 | 9.00 - 12.00 |
| | | රාජ්‍ය අංශයේ මූල්‍ය කළමනාකරණය | 11 | 2012.05.19 | 12.30 - 3.30 |
| 03 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ නිලධරයන් සඳහා වන පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2012.05.20 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2012.04.29 | 12.30 - 3.30 |
| 04 | ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධරයන් සඳහා වන පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2012.05.20 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2012.04.29 | 12.30 - 3.30 |
| 05 | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධරයන් සඳහා වන පළමුවැනි කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය | මූල්‍ය ක්‍රම | 12 | 2012.05.20 | 9.00 - 12.00 |
| | | පරිපාලනය | 04 | 2012.04.29 | 12.30 - 3.30 |
| 06 | දෙවන භාෂා පරීක්‍ෂණය (අදාළ සියලු සේවාවන් සඳහා) | සිංහල (ලිඛිත) | 13 | 2012.05.26 | 2.00 - 4.00 |
| | | දෙමළ (ලිඛිත) | 14 | 2012.05.26 | 9.00 - 11.00 |
| | | ඉංග්‍රීසි (ලිඛිත) | 15 | 2012.05.26 | 11.30 - 1.30 |

15. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණවලට අදාළ විෂයයන්ගේ සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම පහත පරිදි වේ. :—

| *විභාගය* | *විෂයය* | *නිදහස් කරනු ලැබීමට අවශ්‍ය සුදුසුකම්* |
|---|---|---|
| ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධරයන් සඳහා වන පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් විභාගය | ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය හා පරිපාලන නීතිය. ශ්‍රී ලංකාවේ නීති ක්‍රම අපරාධ නීතිය හා සාක්ෂ්‍ය නීතිය | බැරිස්ටර්වරයකු, ශ්‍රේෂ්ඨාධිකරණයේ අධි නීතිඥවරයකු, විශ්වවිද්‍යාලයක නීතිය පිළිබඳ උපාධිධාරියකු වීම |
| | ආර්ථික විද්‍යාව/සමාජ විද්‍යාව | ආර්ථික විද්‍යාව හෝ සමාජ විද්‍යාව පිළිබඳව විශේෂ උපාධිධාරියකු වීම |

16. මෙම විභාග නිවේදනයට විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳ වුව ද, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 17 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණයි)

ශ්‍රී ලංකා පරිපාලන සේවය, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය, ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය සහ ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවයේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සහ දෙවන භාෂාව පිළිබඳ පරීක්ෂණය - 2012 (I)

Efficiency Bar Examination and Second Language Proficiency Test for Officers in Sri Lanka Administrative Service, Sri Lanka Engineering Service, Sri Lanka Scientific Service and Sri Lanka Architects' Service - 2012 (I)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න) (මෙය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.)

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) *උදාහරණ* : SILVA, A. B.
1.2 සම්පූර්ණ නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය :————.
(සිංහලෙන්/දෙමළෙන්)
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය :
ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 ඔබ අයත් සේවය :————.
4.2 එම සේවයට පත් කරනු ලැබූ දිනය :————.

5.0 5.1 තනතුර :————.
5.2 දෙපාර්තමේන්තුවේ නම :————.

6.0 ඔබ ඉල්ලුම් කරන විභාගයන් සහ ඉදිරිපත් වන විෂයයන් :————. (ඔබ විභාගයන් කිහිපයකට ඉදිරිපත් වන්නේ නම් පහත සඳහන් පරිදි වෙන වෙනම සඳහන් කරන්න.)

6.1 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3 ඡේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |
| 6. | | |
| 7. | | |
| 8. | | |

6.2 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3 ඡේදය බලන්න.)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

6.3 විභාගයේ නම :————. සංකේතය :————.
(විභාග නිවේදනයේ 3 ඡේදය බලන්න)

| අනු. අංකය | විෂයය | විෂයය අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

7.0 මීට ප්‍රථම මෙම විභාගයට මුළුමනින්ම හෝ කොටසක් වශයෙන් හෝ පෙනී සිට තිබේද ? :————.
පෙනී සිට තිබේ නම් පහත විස්තර සඳහන් කරන්න.

| විභාගයේ නම | විෂයය | වර්ෂය | මාසය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

8.0 8.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට ද? :————.

8.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තු පිළිබඳ පහත තොරතුරු සඳහන් කරන්න. :

ගෙවන ලද මුදල :————.
රිසිට්පත් අංකය :————.
ගෙවීම් කළ දිනය :————.
ලංකා බැංකු ශාඛාව :————.

| |
|---|
| *මුදල් ගෙවූ රිසිට් පත නොගැළවෙන සේ මෙහි අලවන්න.* |

***අයදුම්කරුගේ ප්‍රකාශය***

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. නියමිත විභාග ගාස්තු ගෙවූ බැංකු රිසිට්පත මේ සමඟ අමුණා ඇති බවත් සහතික කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්‍ෂ විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අපේක්‍ෂකයාගේ/අපේක්‍ෂිකාවගේ අත්සන.

දිනය :————.

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය***

මෙහි විස්තර දැක්වෙන ……………………මහතා/මහත්මිය/මෙනෙවිය හට මෙම විභාගයට පෙනී සිටීමටත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමටත් සුදුසුකම් ඇත.

අපේක්ෂකයාගේ/අපේක්‍ෂිකාවගේ අත්සන සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා තනතුර.

දිනය :————.

03-254

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (**I**, **II** සහ **III** ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| **IV** වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| **V** වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (**I**, **II** සහ **III** ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| **IV** වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| **V** වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2012** | | | | | |
| මාර්තු | 2012.03.02 | සිකුරාදා | 2012.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.09 | සිකුරාදා | 2012.02.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.16 | සිකුරාදා | 2012.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.23 | සිකුරාදා | 2012.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.30 | සිකුරාදා | 2012.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2012.04.05 | බ්‍රහස්පතින්දා | 2012.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.11 | බදාදා | 2012.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.20 | සිකුරාදා | 2012.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.04.27 | සිකුරාදා | 2012.04.11 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

B 2 - B 80306